# මහායාන බෝධිසත්ව සංකල්පය හා බෝධිසත්වයන්ගේ සමාජ සුභසාධන පිළිබඳ විමර්ශනයක්

ඉහළගම බුද්ධප්‍රිය හිමි[1]

## හැඳින්වීම

මහායාන බුදුදහමේ හරය මෙන් ම පරමාදර්ශය වන්නේ බෝධිසත්ව සංකල්පයයි. මෙහි දී බෝධිසත්වවරයා යනු ස්වකීය විමුක්තිය පසෙකලා සකල සත්වයාගේ ම සංසාරික දුක නිවනු පිණිස ඇපකැප වූ මහා කරුණාවෙන් පිරිපුන් උත්තමයෙකි. අසංගාචාර්යයන්ගේ 'අභිධර්මසමුච්චය' වැනි මූලාශ්‍රයවලට අනුව තියුණු ඉන්ද්‍රිය ශක්තියෙන් යුක්තව අනුන්ගේ මිදීම පතන ඕනෑම පුද්ගලයෙකු මහායානිකයෙකු හෙවත් බෝධිසත්වවරයෙකු ලෙස හඳුන්වාදී ඇත. මෙම දර්ශනයේ පදනම වන්නේ කරුණාව සහ ප්‍රඥාවෙන් අනූන වූ බෝධිචිත්තය වන අතර බෝධිචිත්තය යනු සර්ව සාධාරණ, අනිර්මිත හා ශූන්‍ය ස්වභාවයක් ගන්නා පඤ්චස්කන්ධයට පරිබාහිර වූ අධ්‍යාත්මික ශක්තියක් බව පෙනෙන අතර බෝධි චිත්තය උපදවා ගත් සැණින් ඕනෑම සත්වයෙකු බෝධිසත්වභාවයට පත්වන බව නාගාර්ජුන පාදයෝ ද පෙන්වා දෙති. සාම්ප්‍රදායික ථෙරවාද ආකල්ප තුළ එක් කාලයකට එක් බුදුවරයෙකු හෝ බෝධිසත්වවරයෙකු පිළිබඳව පමණක් අවධාරණය වන පසුබිමක, මහායානය 'සෑම සත්වයෙකුම බෝධිසත්වවරයෙකු' ලෙස හඳුන්වමින් පරාර්ථ චරියාව ආගමික පරමාදර්ශය ලෙස ස්ථාපිත කරන අතර බුදුවරයෙකු පරිනිර්වාණයෙන් පසු පරාර්ථ සේවය අවසන් කළ ද බෝධිසත්වවරයා සත්ව ප්‍රජාව නිවන් දකින තුරු සසර රැඳී සිටිමින් අඛණ්ඩව සමාජ සුභසාධනයේ නිරතවන බව පෙනේ. මෙම පර්යේෂණයේ පර්යේෂණ ගැටලුව වන්නේ සාම්ප්‍රදායික ථෙරවාද ආකල්ප තුළ එක් කාලයකට එක් බුදුවරයෙකු හෝ බෝධිසත්ත්වවරයෙකු පිළිබඳව පමණක් අවධාරණය වන පසුබිමක, මහායානිකයන් 'සෑම සත්වයෙකුම බෝධිසත්ත්වයෙකු' ලෙස හඳුන්වමින් පරාර්ථ චරියාව ආගමික පරමාදර්ශය ලෙස ස්ථාපිත කළේ කෙසේ ද? යන්නත් එමඟින් සමාජ සුභසාධනය සඳහා ලැබෙන දාර්ශනික පදනම කුමක් ද? යන්නයි. පර්යේෂණ අරමුණු වශයෙන් බෝධිචිත්තයේ ස්වභාවය සහ එය පුද්ගල අධ්‍යාත්මික සංවර්ධනයට මෙන් ම සමාජ සේවයට බලපාන අයුරු විශ්ලේෂණය කිරීමත්, මහායාන බෝධිසත්ත්ව චරියාව තුළ පවතින 'උපාය කෞශල්‍යය' සහ 'පරාර්ථ චරියාව' හරහා ප්‍රකට වන සමාජ සුභසාධන භූමිකාව හඳුනා ගැනීමත්, ලොකෝත්තර සහ ලෞකික වශයෙන් බෝධිසත්ත්ව සංකල්පය සංවර්ධනය වී ඇති ආකාරයත් විමසුමට ලක් කරනු ලබයි. සමස්ත කරුණු අනුව මහායාන බෝධිසත්ත්ව සංකල්පය සහ බෝධිසත්වයන්ගේ සමාජ සුභසාධන පිළිබඳ විමර්ශනයක් සිදු කිරීම මෙම පර්යේෂණය මගින් අපේක්ෂා කෙරේ.

1 බෞද්ධ දර්ශනය අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව. ihalagamabuddhapriya@gmail.com

**පර්යේෂණ ක්‍රමවේදය**

මෙම අධ්‍යයනය සඳහා මූලික වශයෙන් සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය, ශාන්තිදේවයන්ගේ බෝධිචර්යාවතාරය වැනි මූලාශ්‍රය තුළ අන්තර්ගත බෝධිසත්ත්ව චරිතය පිළිබඳ තොරතුරු ගුණාත්මක විශ්ලේෂණ ක්‍රමවේදය යටතේ භාවිත කර ඇත.

**ප්‍රතිඵල සහ සාකච්ඡාව**

බෝධිසත්වයන් වහන්සේ ස්වාර්ථ, පරාර්ථ සාධනයෙහි නියුතු උත්තුංග හා පරමාදර්ශී පුරුෂයෙකි. ථෙරවාද සම්ප්‍රදායේ එන බෝධිසත්වයන්ට වඩා මුළු මහත් ජීවිතයම පරාර්ථය බවට පත්කරගත් බෝධිසත්ව ප්‍රතිපදාවක් මහායාන බෝධිසත්ව සංකල්පයේ දැක්වේ. එම බෝධිසත්වයන් වහන්සේට තමන් වහන්සේගේ අභිමතය පරිදි ඕනෑම අවස්ථාවක දී වුව ද බුද්ධත්වයට පත් විය හැකි ය. එසේ වුව ද මේ තුන් ලෝ ධාතුවෙහි යම්තාක් සත්වයෝ වෙසෙත් ද ඒ කවර සත්වයෙකු වුව ද සංසාර දුකින් මුදවා ගන්නා තෙක් තමන් වහන්සේ ස්වකීය බුද්ධත්වය ප්‍රමාද කිරීම මහායාන බෝධි චිත්තයේ සුවිශේෂී ලක්ෂණයකි. බෝධිචර්යාවතාරයට අනුව, බෝධිසත්වයන් වහන්සේ ප්‍රථමයෙන් සම්‍යක් සම්බෝධිය ප්‍රාර්ථනා කිරීමේ චිත්තය උපදවාගෙන තදනන්තරව බෝධිචිත්තය සමාදන්ව එහි හැසිරීමේ සිත් ඇති කරගනී. එසේ සම්බෝධිය ප්‍රාර්ථනා කිරීම 'ප්‍රණිධි' නම් වන අතර බෝධිසත්ව ශික්ෂා සමාදානය ප්‍රස්ථාන නමින් හැඳින් වෙයි. බෝධිසත්වයන් වහන්සේ ලොවෙහි අප්‍රමාණ සත්වයන් සසරින් මුදවන්නේ ය යන දැඩි සිත තම චිත්ත සන්තානය තුළ පිහිටුවා ක්‍රියා කරන්නෙකි. බෝධිචිත්තය පහළ වූ තැන් පටන් උන්වහන්සේගේ සසර ගමන සීමා සහිත වන අතර මහායාන දර්ශනයට අනුව සෑම සත්වයකු තුළ ම බෝධිසත්වයකු වීමේ මූල බීජ පවතී. සෑම සත්වයකු තුළ ම මිලිනව පවත්නා ධර්මකාය ද එය ම වන අතර බෝධිචිත්තය පහළවීමත් සමඟ ධර්මකාය ප්‍රකට වීමට පටන් ගනී. එලෙස බෝධිචිත්තය පහළවීමත් සමඟ දුක් විඳින අප්‍රමාණ සත්වයන් විෂයෙහි උපන් කරුණා මෛත්‍රියෙන් යුතුව ඒ සත්වයන්ගේ නාමයෙන් බෝධිසත්වයන් වහන්සේ සසර දුකට අවතීර්ණ වී අප්‍රමාණ වශයෙන් දුක් කරදර විඳීමට ඉදිරිපත් වේ. මෙම සංසාරගත සත්වයා රාග, ද්වේෂ, මෝහ කෙළෙස් හි වෙළී පැටලී අප්‍රමාණ දුක් විඳිමින් සිටින අතර ඔවුහු කර්මය එහි ප්‍රතිවිපාක විශ්වාස නොකරති. එබැවින් මිථ්‍යා දෘෂ්ටියට පත්ව ඇත. විමුක්ති මාර්ගය සෙවීම උදෙසා ආත්මාග්‍රහණයෙන් අත්මිදීමට උත්සුක නොවෙති. එබඳු සත්ත්වයන් දුකින් මුදවනු පිණිස ඔවුන්ගේ දුක තමාගේ දුකක් ලෙස සලකා ඒ සියල්ල තමා වෙත පවරා ගැනීමට තරම් බෝධිසත්වයන් පරහිතකාමී වේ. මෙම බෝධිසත්වයන් වහන්සේ ලෝකය පවත්නා තෙක් සීමා රහිතව සත්ත්වයාට අනන්ත කාලයක් මුළුල්ලෙහි සියලු සත්වයාගේ ම මනදොළ පුරමින් දන් දීමට ඉදිරිපත් වන බව ප්‍රකාශ වීමෙන් උන්වහන්සේගේ දාන චේතනාව සීමාවක් නොමැති බව ප්‍රත්‍යක්ෂ වේ. දුකට පත් වූවන් සුවපත් කිරීම පරමාධ්‍යාසය කොටගත් බෝධිසත්වයන් වහන්සේ මඟ නොමඟ නොදැන මෝහාන්ධකාරය නිසා දුකට පත්ව සිටින සත්වයන් සඳහා ධර්ම ප්‍රදීපය දල්වන ලෙස සියලු බුදුවරුන් සඳහා ආරාධනා කරන බව මූලාශ්‍රය තුළින් පිළිබිඹුවන්නකි.

පූජනා, පාපදේශනා, පුණ්‍යානුමෝදනා සිදුකොට කරන ලද කුසල ක්‍රියාවන්ගෙන් ජනිත වන පුණ්‍ය ශක්තිය උපකාර කොටගෙන සියලු සත්වයන් දුකින් එතෙර

කරවන්නෙක් ලෙස පෙනී සිටීමට බෝධිසත්වයන් ඉදිරිපත් වන බවක් පෙනේ. එහි දී හෙතෙම ගිලනුන්ට ඖෂධයක් වීම, වෛද්‍යවරයෙක් වීම, රෝගය සුවපත් වනතෙක් උපස්ථායකයකු වීම, අඛණ්ඩව පවත්නා වර්ෂාවක් සේ බඩසයින් පෙළෙන්නන්ට ආහාර පාන දීමෙන් බඩ සා දුක නැති කිරීමට සහ දුර්භික්ෂාන්තර කල්පයන්හි පැන් හා බොජුන් වීමට කැමති වේ. බෝධිචර්යාවතාරයේ තුන්වන පරිච්ඡේදය වෙන්කර ඇත්තේ බෝධිසත්වයන් පරදුක්ඛිත සත්වයන්ගේ යහපත සඳහා පරාර්ථ සාධනය සිදුකරන ආකාරය යි. එහි අන්තර්ගත බෝධිසත්වයන් වහන්සේගේ ප්‍රාර්ථනාවන් හා අපේක්ෂාවන් පරමාදර්ශී උත්තම පුරුෂයකු තුළින් පමණක් ප්‍රකට වන අභිධානයක් වශයෙන් පෙන්වා දිය හැකි ය. මෙලෙස තම බෝධිචිත්තය අන්‍යයන්ගේ සිත සුව සඳහා කැපකිරීමට කැමති බෝධිසත්වයන් වහන්සේ අනන්ත ආකාස ධාතුව තුළ ව්‍යාප්තව පවතින්නා වූ සයනාසන ශෂ්‍ය ඵල මූල ආදී වශයෙන් හෝ යාන වාහන ආදී වශයෙන් හෝ පඨවි, ආපෝ, තේජෝ, වායෝ යන චතුර්විධ පදාර්ථ වශයෙන් සියලු සත්ත්වයන් සංසාරයෙන් මිදී නිවන් අවබෝධ කරත් ද ඒතාක් සත්වයන්ගේ අනේක ලෙසින් උපයෝගී කටයුතු වස්තුවක් ලෙසින් ක්‍රියා කරන බවට ප්‍රතිඥා දෙනු ලබයි. මේ අයුරින් මහායාන බෝධිසත්ව සංකල්පය තුළ පරාර්ථය මුල්කරගත් සමාජ සුභසාධනය කෙරෙහි නිරන්තර අවදිකමකින් ක්‍රියා කරන්න පරමාදර්ශී චරිතයක් වශයෙන් බෝධිසත්වයන් ඉදිරිපත් කර ඇති බව පෙනේ. බෝධිසත්වයන්ගේ පාරමී පූර්ණය ද ස්වාර්ථ, පරාර්ථ සාධනයනයෙහි ම කොටසක් බව සමස්ත කරුණු මගින් පෙනී යයි.

**නිගමනය**

මහායාන බෝධිසත්ව සංකල්පය සහ සමාජ සුභසාධන ක්‍රියාවලිය පිළිබඳ සිදුකළ මෙම විමර්ශනයේ දී කරුණු කිහිපයක් ස්ඵුට වේ. මහායාන දර්ශනය තුළ බෝධිසත්වවරයා යනු හුදෙක් ආගමික සංකේතයක් පමණක් නොව එය පරමාදර්ශී සමාජ සේවා ව්‍යුහයක මානුෂීය ප්‍රතිමූර්තියක් බව පැහැදිලි වේ. අධ්‍යාත්මික පදනම සහ සමාජ වගකීම මහායාන ඉගැන්වීම්වලට අනුව බෝධිසත්වවරයා ස්වකීය පුද්ගල විමුක්තිය පසෙක ලා සසර රැඳී සිටීමට තීරණය කරන්නේ කරුණාව සහ ප්‍රඥාව පදනම් කරගත් සමාජ වගකීමක් වශයෙනි. මෙය 'බෝධිචිත්තය' මගින් මෙහෙයවන අතර එමගින් පුද්ගල අධ්‍යාත්මික දියුණුව සහ සමාජ සුභ සාධනය අතර පවත්නා අවිච්ඡේද්‍ය සබඳතාව තහවුරු කරයි. විශ්වීය බෝධිසත්ව පරමාදර්ශය ථෙරවාදයේ එන ඒක පුද්ගල බෝධිසත්ව සංකල්පය ඉක්මවා යමින් 'සෑම සත්වයෙකු තුළම බුද්ධ ස්වභාවය පවතී' යන මහායාන මූලධර්මය හරහා සමාජයේ සෑම පුද්ගලයෙකුම විභව්‍ය බෝධිසත්වවරයෙකු ලෙස හඳුනා ගැනේ. මෙහි ප්‍රතිඵලයක් ලෙස සමාජ සේවය යනු බාහිරින් පැටවුණු කාර්යයක් නොව, බුද්ධත්වය කරා යන ගමනේ අත්‍යවශ්‍ය ප්‍රායෝගික අභ්‍යාසයක් බවට පත් වේ. ප්‍රායෝගික සමාජ සුභසාධනය ශාන්තිදේවයන්ගේ 'බෝධිචර්යාවතාරය' වැනි මූලාශ්‍රය පිරික්සීමේ දී පෙනී යන්නේ, බෝධිසත්වවරයා සමාජ සුභසාධනයේ දී වෛද්‍යවරයෙකු, උපස්ථායකයෙකු, ආහාර පාන සපයන්නෙකු සහ මගපෙන්වන්නෙකු ලෙස භූමිකා රාශියක් නිරූපණය කරන බවයි. මෙය නූතන සුභසාධන රාජ්‍යයක පැවතිය යුතු සාමූහික වගකීම පිළිබඳ දාර්ශනික පසුබිම මැනවින් නිරූපණය කරයි. උපාය කෞශල්‍යය සහ කාලීනත්වය සත්වයන්ගේ දුක නිවීමට බෝධිසත්වයන් භාවිතා කරන උපාය කෞශල්‍යය මගින් ගම්‍ය වන්නේ සමාජ සේවයේ දී පවතින නම්‍යශීලී බව සහ නිර්මාණශීලී ප්‍රවේශය යි. අවසාන වශයෙන් මහායාන බෝධිසත්ව සංකල්පය යනු

ලොකෝත්තර ඉලක්කයක් සපුරා ගැනීම සඳහා ලෞකික සමාජය සුවපත් කළ යුතුය යන ක්‍රියාකාරී මානුෂවාදය  මත පදනම් වූ දර්ශනයකි. තමා සතු සියල්ල  අන්‍යයන්ගේ යහපත උදෙසා කැප කිරීමේ මෙම උත්තුංග චරියාව, නූතන ලෝකයේ පවතින අර්බුද හමුවේ සමාජ සහජීවනය සහ සුභසාධනය තහවුරු කිරීමට යොදාගත හැකි ප්‍රබලතම ආචාරධර්මීය පදනම බව නිගමනය කළ හැකි ය.

**ප්‍රමුඛ පද** - බෝධිචිත්තය, බෝධිසත්ව සංකල්පය, මහායානය, සමාජ සුභසාධනය

**ආශ්‍රිත ග්‍රන්ථ**

උපාධ්‍යාය, බලදේව, (පරි) පඤ්ඤාකිත්ති හිමි හිරිපිටියේ (1996). *බෞද්ධ දර්ශනය.* කොළඹ: එස්. ගොඩගේ සහ සහෝදරයෝ.

සාසනරතන හිමි, මොරටුවේ (1999). *ලක්දිව මහායාන අදහස්.* බොරලැස්ගමුව: විසිදුනු ප්‍රකාශනයකි.

සාසනරතන හිමි, මොරටුවේ (1966). *බෝධිචර්යාවතාරය.* කොළඹ: අනුල මුද්‍රණාලය.

පඤ්ඤාකිත්ති හිමි, එම්. (2001). *සද්ධර්මපුණ්ඩරීක සූත්‍රය,* විචාරාත්මක අධ්‍යයනයක් සහිත සිංහල අනුවාදය. කොළඹ: එස්. ගොඩගේ සහ සහෝදරයෝ.

Asanga (2001). *Abhidharmasamuccaya, The Compendium of the Higher Teaching, 'Trans'* Walpola Rahula.[ English version by Sara Boin-Webb] Fremont, Asian Humanities Press.

Shan tideva (1997). *The Bodhicaryavatara* [Trans] Kate Crosby & Andrew Skilton Oxford: Oxford University Press.